# බලශක්තිය

## සහ

## මා

Allan Drummond

ලෝක බලශක්ති ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් සිදු වෙමින් පවතින බව අපට දැකිය හැකි ය. මෙම වෙනසට නායකත්වය දෙන්නේ කවුරුන් ද යන්න සහ පිරිසිදු ශක්තිය වෙත වූ ගෝලීය සංක්‍රමණය සඳහා සහභාගී වීමට අප සැමට ඉගෙන ගත හැකි ආකාරය මෙම පොත මගින් විමසා බැලෙයි.

පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ අරමුදලිනි.

[illegible]

please use Commonwealth logo only

The Commonwealth

CHOGM SAMOA2024

Commonwealth Heads of Government Meeting

21–26 October 2024

thecommonwealth.org/chogm

One Resilient Common Future: Transforming our Common Wealth


මෙම ප්‍රකාශන ද ලබා ගතහැකිය





පිරිසිදු බලශක්තිය වෙත වූ මංපෙත්
Allan Drummond




අප අවට ඇති බලශක්තිය
Allan Drummond






පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ
Alache Fisho, Victor Kitange, Sherry Dixon
ඔබේ නිර්මාණාත්මක දිරි ගැන්වීම සහ මග පෙන්වීම් සඳහා ස්තූති යි.
ඇන්ග්ලියා රස්කින් විශ්ව විද්‍යාලයේ ගෝලීය ස්ථායීකරණ ආයතනයේ
ආචාර්ය ඇලඩ් ජෝන්ස්, ඔබේ ද අදහස් සහ යෝජනා සඳහා ස්තූති යි.



පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය @2021



විස්තර සහ පෙළ - Allan Drummond
චිත්‍ර නිර්මාණ - Keith Drummond
නිර්මාණ සහකාර - Olivia Daw



මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රකාශකයාගේ අවසරයකින් තොර ව, පිටපත් කිරීම, ශබ්ද පටිගත කිරීම යනාදිය ඇතුළු ව, ප්‍රතිනිෂ්පාදනය කිරීම, නැවත ලබා ගැනීමේ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් හෝ විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රමයෙකින් සම්ප්‍රේෂණය නොකළ යුතු ය.
පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ අරමුදලිනි.



ISBN 9781849292023


The Commonwealth

## කර්තෘගේ සටහන

අපේ බලශක්තිය, එය අපට ලැබෙන ආකාරය සහ අප එය භාවිත කරන ආකාරය යන මේවා අප දිවි ගෙවන ආකාරය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. එය සැමවිට ම සිදු වී ඇත. අලුතින් එළි දකින නව බලශක්ති පද්ධති ජනතාවගේ ජීවිතවලට කෙසේ බලපාන්නේ ද යන්න සහ ලොව පුරා සැම දෙනාට ම මෙම බලශක්ති සංක්‍රාන්තිය නිසා ඇතිවන අවස්ථා පිළිබඳ පුළුල් චිත්‍රය පිළිබඳ ව සලකා බැලීම වෙන කවරදාටත් වඩා අද ගුරුභවතුන්හට මෙන් ම සිසුන්හට ද ඉතා වැදගත් වේ. අප අවට දැවැන්ත ඉදිරි ගමනක් සිදු වෙමින් පවතී. සැමට සමාන ලෙස ප්‍රතිලාභ ලබා දීමේ විභවයක් එය සතු වේ.

මම ලොව වටා රටවල් කිහිපයකට ගොස් ඇති අතර, තිරසාරභාවය සහ පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්තිය වීම පිළිබඳ ව බොහෝ පැති ගැන සිසුන් කරුණු හදාරන පාසල්වලට ද ගොස් ඇත්තෙමි. සිසුන් දැනටමත් මෙම විෂය ගැන දන්නා ප්‍රමාණය පිළිබඳ ව ඇසීමේ දී මම සැමවිට ම පාහේ විස්මයට පත් වීමි.

මෙම පොත සඳහා මම මගේ සංචාර වලින් ලත් පෞද්ගලික අත්දැකීම් තුළින් වර්ධනය කරගන්නා ලද සිද්ධි දාම කිහිපයක් පිළිබඳ ව සිතා බැලුවෙමි. මගේ අරමුණ වන්නේ පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්තියේ දී සිසුන්ට හා ගුරුභවතුන්ට ඒ සඳහා ඉටු කළ හැකි කාර්ය භාරය පිළිබඳ ව උනන්දු කරවීම හා ඒ පිළිබඳ ව සංවාදයක් ආරම්භ කිරීම යි.

## ප්‍රකාශකගේ සටහන

මෙම පොත පොදු රාජ්‍ය මණ්ඩලීය තිරසාර බලශක්ති සංක්‍රාන්ති වැඩ පිළිවෙල යටතේ ප්‍රකාශිත යි. මෙම වැඩපිළිවෙළ අඩු කාබන් බලශක්ති පද්ධති වෙත සංක්‍රමණය වීම වේගවත් කිරීමට සහ හත්වැනි තිරසාර සංවර්ධන අරමුණ (SDG7) සාධනය කර ගැනීම උදෙසා පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් අතර සහයෝගිත්වය සඳහා වන වේදිකාවකි. දරුවන් සහ තරුණයින් තිරසාර සහභාගීත්ව සංවර්ධනයේ කේන්ද්‍රයෙහි තබා ගනිමින්, ඔවුන් වෙත ආයෝජනය කිරීමට, සියයට හැටකට වැඩි වූ අවුරුදු 30ට අඩු පොදු රජ්‍ය මණ්ඩල ජනගහනය සමග පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය කැප වී සිටී යි. පොදු රාජ්‍ය මණ්ඩලය පුරා සිටින පාසල් වියේ දරුවන් අතර බලශක්ති සාක්ෂරතාව සහ නවෝත්පාදනය වැඩිදියුණු කිරීම සඳහා වූ මෙම උද්යෝගිමත් මුල් පියවර පිළිබඳ වැඩි දුර කරුණු සොයා ගැනීම සඳහා කරුණාකර Sustainableenergy@commonwealt.int සබැඳිය භාවිත කරන්න.


h



මධ්‍යම අප්‍රිකාවේ නගරයක ළමයි පාසලට ඇවිද ගෙන යති. මේ සමහර නිවෙස් පිහිටා ඇත්තේ ගුවන් තොටුපළට යන මාර්ගයට ආසන්නයේ යි.

ඡායාරූප - Allan Drummond





# බලශක්තිය

## සහ

## මා

Allan Drummond


## විශාල වෙනස්කම්

පිරිසිදු ශක්තිය සඳහා වන ගෝලීය සංක්‍රාන්තිය පිළිබඳ ව සෑම තැනක ම බොහෝ උනන්දුවක් සහ ප්‍රවෘත්ති දක්නට ලැබෙනවා. එයට හේතුව, අප අසා ඇති පරිදි, දහනය වන පොසිල ඉන්ධන මඟින් කාබන් ඩයොක්සයිඩ් වායුව විමෝචනය වීම ලෝක දේශගුණයට බලපෑම් කරමින් ගෝලීය උෂ්ණත්වය ඉහළ නැංවීමට දායක වීම යි. ලෝකය ඒ සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගත යුතු වෙනවා.

කාර්යක්ෂම නව ශක්ති පද්ධති සංවර්ධනය වෙමින් පවතිනවා. ඒ වගේ ම විශාල සැලසුම් ද සකස් වෙමින් පවතිනවා. එහෙත් මේ සියල්ල ලොව පුරා සිටින ජනතාවගේ එදිනෙදා ජීවිතයට බලපාන්නේ කෙසේ ද? ඔබට කුමක් සිදුවේ ද? එසේ ම ඔබට කුමක් මේ සඳහා කළ හැකි ද?

ලෝක නායකයින් පිරිසිදු ශක්තිය සඳහා සිදුවන වෙනස් වීම පිළිබඳ ව පහත දැක්වෙන කරුණු සඳහා එකඟත්වය ප්‍රකාශ කර තිබෙනවා. එනම්, එම වෙනස්වීම අන්තර්කරණය විය යුතු යි. එම වෙනසට සැවොම සම්බන්ධ විය යුතු ය යන්න ඉන් අදහස් වෙනවා. එසේම, එම වෙනස්වීම යුක්ති සහගත විය යුතු යි. එනම්, සැමට අපක්ෂපාතී ව සැලකිය යුතුයි. තවද, එය සාධාරණ විය යුතු යි. එනම්, සැමට සමාන ව සැලකිය යුතු යි යනුවෙනි.

ඔබ අපේක්ෂා කරන පරිදි, විවිධ ප්‍රදේශවල සිටින විවිධ පුද්ගලයින් සඳහා එක් එක් ආකාරයේ වෙනස් වීම් සිදුවිය හැකි යි.



මගේ නිවස පිහිටා තිබෙන්නේ නගරයේ සිට ගුවන් තොටුපළට යන ඉතා කාර්ය බහුල මාර්ගය අසල යි.

ශක්තිය තිරසාර ලෙස භාවිත කිරීම සඳහා අප සියල්ලන් ම ඥානවන්ත ව කටයුතු කළ යුතු ආකාරය ගැන මා පාසලේ දී ඉගෙන ගනිමින් සිටිනවා.

මෙහි බොහෝ වෙනස්වීම් සිදු වෙමින් පවතිනවා. එය හරියට මුළු ලෝකය මා පසුකර ගෙන යනවා වගෙයි.

අපේ පුංචි රටට විශාල ගුවන් තොටුපළක් සහ ඒ වෙත යාමට විශාල මාර්ගයක් අවශ්‍ය නිසා නව මාර්ගයක් ඉදි වෙමින් පවතිනවා.





## එය පාසලෙන් ආරම්භ වේ

පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්ති වීම දෙස බැලීමට සුදුසු ම ස්ථානය පන්ති කාමරය යි. උද්යෝගිමත් නව අදහස්, වැදගත් නව ප්‍රතිපත්ති, තීරණාත්මක ඉලක්ක සහ සිදුවෙමින් පවතින දේ පිළිබඳ ලෝක දැක්මක් යන මේ සියල්ල ගුරුභවතුන්ට සහ සිසුන්ට මේ සියල්ල එක් ව ගවේෂණය කළ හැකි වෙනවා.

සිදුවන්නේ කුමක් ද සහ එය සිදුවන්නේ මන්දැයි පළමුවෙන් ම සොයා බැලීම වැදගත් වෙනවා. පිරිසිදු ශක්තිය වෙත යා හැකි මාර්ග මොනවා ද?

එහි දී පුනර්ජනනීය ශක්ති ප්‍රභව අප වටා ඇති බව වටහා ගැනීම වැදගත් වෙනවා. මෙය දැන ගැනීමෙන් අප වටා ඇති ශක්තිය එක් රැස් කර ගැනීම සඳහා නව තාක්ෂණය භාවිත කළ හැක්කේ කෙසේ ද යන්න තේරුම් ගැනීමට අපට උපකාරී වෙනවා. මේ සියල්ල ගැන ඉගෙන ගැනීම අපට කළ හැකි පළමු හා වඩාත් ම වැදගත් දෙය යි. මෙම අදහස් මත අපට එක් වී වැඩ කළ හැකි ස්ථානය පාසල යි.

අප වෙත ශක්තිය පැමිණෙන්නේ කොහි සිටද යන්න සහ එය ප්‍රවේශමෙන් හා කාර්යක්ෂම ව භාවිත කළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ව දැනුවත් ව, පිරිසිදු ශක්තිය වෙත සංක්‍රමණය වීම සඳහා තනි තනි ව අපට කුඩා පියවර ගත හැකි වෙනවා. මේ පිළිබඳ ව ඔබට ගත හැකි පියවර මොනවා ද?

ඒ නිසා මා හිතන්නේ එය අප වගේ තරුණ තරුණියන්ට ගොඩක් වැදගත් වෙනවා කියල යි.

සමහර විට බොහෝ දේ සිදු නොවන බව අපට දක්නට ලැබේ වි, එහෙත් වෙනස්කම් සිදු වෙමින් පවතිනවා.

ලෝකය අප ව පසු කර යන්නේ නැහැ. අප ලෝකය සමග සිටිනවා.

පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්තිය සිදු වීමේ දී යෞවනයන් සැබැවින් ම ඉතා වැදගත් වෙනවා.

අප සෑම දෙනා ම තාක්ෂණයට ආදරෙයි.

අපි පාසල තුළ සහ ඉන් පිටත විශිෂ්ට සන්නිවේදකයෝ වෙන්නෙමු.

වෙනස්වීම් තේරුම් ගැනීමට එකිනෙකා දිරි ගැන්වීමටත්, ඔවුනට ඒවා ක්‍රියාවට නැංවීමට උදව් කිරීමටත් අපට අවශ්‍ය ව තිබෙනවා.

එය ආරම්භ වෙන්නේ පාසලෙනු යි. මේ සියලු ම කාර්ය සිදු කරන්නේ අප ම යි.







මිනිසුන් නිතර ම රට තුළට සහ ඉන් පිටතට ගුවනින් යන එන අන්දම මා දකිනවා. ලෝකයේ විශාල වෙනස්කම් සිදුවෙමින් පවතින බව මට ~~දැකිය හැකි වෙනවා~~. පේනවා.

මට තවමත් බෙහෙවින් වෙනසක් සිදු වී නැහැ. ඇත්ත වශයෙන් ම, අපට විදුලි සම්බන්ධතාව ලැබුනා පමණ යි.

විදුලිය ලබා ගැනීම දුෂ්කර විය හැකි යි.





අනික අපේ ගෙදර හැමවෙලාවෙ ම
විදුලිය නැති වී යනවා!




අනික් හැම දෙනා ම වගේ අපේ අම්මා විවෘත ලිපේ උයන නිසා අපට ගැටළුවක් නැහැ.
ඒත් ගින්න නිසා සෑම තැනක ම නරක දුමාරයක් ඇති වෙනවා.
එය පිරිසිදු ශක්තියක් නොවෙයි. ඒ වගේ ම සියලු වාහනවලින් ද දුම් පිටවෙනවා.






විරෝධතා සහ උද්ඝෝෂණ ගැන ඔබ සිතන දේ කුමක් වුවත්, මහජන මතය ආණ්ඩුවලට බලපෑම් කර තිබෙන බවට සැකයක් නැහැ. එසේ ම එය **පිරිසිදු ශක්තිය දෙසට යම් සංක්‍රමණයක් වීම සඳහා** තුඩු දී ඇති බවට ද සැකයක් නැහැ.

නිරන්තරයෙන් ජනතාව දේශීය වශයෙන් හෝ කලාපීය වශයෙන් හෝ ධනාත්මක වෙනස්කම් සිදු කර තිබෙනවා.

අප දකින බොහෝ වෙනස්කම් සිදු වීම
තරුණයන්ගේ හඬ නිසා බල ගැන් වී තිබෙනවා.

සමහරු සිකුරාදා පාසල් යාම ප්‍රතික්ෂේප කර ඒ වෙනුවට බැහැර පෙදෙස්වලට ගොස් දේශගුණික හදිසි ආපදා ගැන උද්ඝෝෂණ පවත්වා තිබෙනවා. ඔවුන්ට දැන් ධනාත්මක වෙනසක් කිරීමට අවශ්‍ය ව තිබෙනවා.


ඔබ රූපවාහිනියෙන් මේ තරුණයින් දැක ඇති.

ඔබ පවා මෙම විරෝධතාවලට සහභාගි වී තිබෙන්න ඇති.






පෙරේරා මහත්මියගේ සාප්පුවේ දුරකථන ආරෝපණය කිරීම සඳහා වහලය මත සූර්ය පැනලයක් සවිකර තිබෙනවා. එනම් එය තිරසාර ශක්තිය යි.
- ඉතින්, ඇය වෙනස් වීමේ කොටස් කාරියක් බව මා හිතනවා.




එසේ ම අවසානයේ අන්තර්ජාලය පාසලට පැමිණ තිබෙනවා.




ඒත් ලෝකය මා පසුකර යන බවක් මට තවමත් දැනෙනවා.
කොහොම ද මේ වෙනස අප වෙත එළඹෙන්නේ?
ජනතාව ඒ සඳහා කුමක් ද කරන්නේ?
මා කළ යුත්තේ කුමක් ද? ඔබට ඒ සඳහා කළ හැක්කේ කුමක් ද?



## මේ කතාන්තරයේ...

සිදුවෙමින් පවතින වෙනස්කම් නිසා බැරෑරුම් ප්‍රශ්න ඇසීමට සිදු වෙනවා. එනම්, ලෝකයේ විදුලිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඇත්තේ කාට ද?. පිරිසිදු ශක්තිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඇත්තේ කා හට ද?

මෙම කතාවේ එන පිරිමි දරුවාගේ පවුලට ආලෝකය ලබා ගැනීමට සඳහා විදුලිය තිබෙනවා. නමුත් ඔවුන්ට වියදම් දරා ගත හැක්කේ ඒ සඳහා පමණ යි. ඒ වගේ ම ප්‍රදේශයේ විදුලිය නිතර ම විසන්ධි වන නිසා එය එතරම් හොඳ තත්ත්වයක් නොවේ යි.

මෙම පවුලට ආහාර පිසීම සඳහා පිරිසිදු ශක්ති ප්‍රවේශයක් නොමැති යි. එය ලොව පුරා බොහෝ රටවල දක්නට ඇති තත්ත්වයක්! මේ ළමයාගේ මව දර සහ ඉවත ලන ද්‍රව්‍ය භාවිතයෙන් විවෘත ලිපකින් උයනවා. ඉවුම් පිහුම් සඳහා දර සහ ඉවත ලන ද්‍රව්‍ය භාවිත කිරීමේ දී ඉවත ලන ද්‍රව්‍ය මගින් වායු මුදා හරිනු ලබනවා. එම වායු මගින් ගින්න අවට සිටින පුද්ගලයින්ට සහ ලෝකයේ දේශගුණයට ද හානි සිදු වෙනවා.

සාප්පු හිමිකාරිය වන පෙරේරා මහත්මියට ඇයගේ සූර්යපැනල වලින් ලැබෙන විදුලියෙන් පුද්ගලයින්ට තම දුරකථන ආරෝපණය කර දෙනවා වෙනුවෙන් ඔවුන්ගෙන් මුදල් අය කිරීමේ ක්‍රමයක් ද තිබෙනවා. මෙය ලෝකයේ සතුටු දායක නව වර්ධනයක්. මෙය ඉතා කුඩා පරිමාණයේ උදාහරණයක් වුව ද, අපට මෙයින් අවධානය ඇති කරවන පාඩම් ඉගෙන ගන්නට තිබෙනවා:


ඇය භාවිත කරන්නේ පුනර්ජනනීය හා පිරිසිදු ශක්ති ප්‍රභවයක් වන සූර්ය බලශක්තිය යි. එය ප්‍රාදේශීය ව සිදු කර ගනු ලබන එකක්! ඇයගේ උපක්‍රමය දුරස්ථ බල ශක්ති ප්‍රභව මත රඳා පවතින එකක් නොවෙයි. බලශක්තිය ලබා ගැනීම අතින් ඇය ස්වාධීන යි. එය කුඩා පරිමාණයේ වෙනසක්! ලොව පුරා බොහෝ පුද්ගලයින් එවැනි ද සිදුකර ගන්නා විට එය වැදගත් එකක් වෙනවා.

අපට සිතන්නට බොහෝ දේ තිබෙනවා.

නව පිරිසිදු ශක්තිය භාවිතයෙන් ක්‍රියාත්මක වන පිසීමේ උදුන් සඳහා මුදල් ආයෝජනය කිරීමට දේශීය නායකයින් එකඟ වී ඇති බව පසුගිය මාසයේ දී අපගේ ගුරුතුමා අපට පැවසුවා.

එය හොඳ වෙනසක්! එය වටපිටාවට මුදා හරින දුම් අඩු කරනවා. ඒත්, මෙම වෙනස්කම් තීරණය කරන්නේ කවුරුන් ද?

අපට ගොඩක් අලුත් දේවල් අහන්න ලැබෙනවා...






එහෙත් වෙනත් බොහෝ ක්ෂේත්‍රවල දී ද නිපුණතා අවශ්‍ය වෙනවා. උදාහරණ වශයෙන්...




මෙම වෙනස සිදු වන අතරතුර රැකියා වෙනස් වන පුද්ගලයින්ට ද නව නිපුණතා අවශ්‍ය වෙනවා...



එ බැවින්, පිරිසිදු ශක්තිය වෙත සංක්‍රමණය වීමේ දී, තරුණ පිරිස් බලවත් නව බලකායක් වෙනවා.

සමහර දෙනෙකු ඒ බව දැනටමත් සනාථ කර තිබෙනවා.



## තරුණ ප්‍රජාව


පිරිසිදු ශක්තියට සංක්‍රමණය වීම හා සම්බන්ධ නව අදහස් සහ නව තාක්ෂණය උද්යෝගය දනවනසුලුයි. කුතුහලයෙන් පිරි, බොහෝ සේ සිතන, ගැටළු සහ හැකියාවලින් උද්යෝගයට පත්වන දක්ෂ තරුණයින්ගේ දායකත්වය මෙම වෙනස්වීම්වලට ජීවය සපයනවා.


විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය හැදෑරීම, පිරිසිදු ශක්තිය සඳහා නව අදහස් පිළිබඳ ව සිතීමට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් ට හොඳ ආරම්භයක් වෙනවා.

නව අදහස් සහ නව ක්‍රම ගැන සිහින දකින විට එහි සීමාවක් නැහැ. නිර්මාණ කිරීම සහ ගැටළු විසඳීම සඳහා උනන්දුවක් දක්වන පුද්ගයින්ට වැදගත් වන්නේ නිර්මාණශීලී මනස යි. වෙනස්වීම්වල දී ජනතාව සහ ප්‍රතිපත්ති සම්බන්ධ නිසා, නීතිය, දේශපාලනය සහ සමාජය ක්‍රියා කරන ආකාරය ගැන උනන්දුවක් දක්වන අයට ද පිරිසිදු ශක්තියට අදාල ව භූමිකාවක් තිබිය හැකි යි.

ඔබ උනන්දු වන්නේ කුමන විෂයයන් සඳහා ද?

අපි පාසලේ දී සහ පසුව විශ්ව විද්‍යාලයේ දී ඉගෙන ගන්නා දේ, අපට තවත් ඉදිරියට ගෙන යා හැකි නම්, එය ඉතා වැදගත් වේවි. නව විසඳුම් එළිදරව් කිරීම සඳහා අපට උදව් කළ හැකි යි. ඉගෙන ගත යුතු වැදගත් විෂය කිහිපයක් තිබෙනවා. ඒවා නම්...




නීතිරීති මොනවා ද?

ඒවා පනවන්නේ කවුරුන් ද?

පිරිසිදු ශක්තියට සංක්‍රමණය වීමේ කොටස්කරුවකු වීමට මා ඉගෙන ගන්නේ කොහොම ද?

සියලු ම රටවල සිටින සෑම දෙනා ම එක් වී වැඩ කිරීම සඳහා යොදා ගැනීමට අපට හැකි වන්නේ කොහොම ද?



## කුඩා පියවර වැදගත් වේ

අප කැමති වුවත්, නැතත් පිරිසිදු ශක්තියට සංක්‍රමණය වීම සිදුවෙමින් පවතිනවා. එය අභියෝගයක්, එහෙත් එය ප්‍රබෝධ ජනක එකක්! වෙනස ඉතා විශාල යි, "මට කුමක් කළ හැකි වේවි ද" යනුවෙන් ඔබ අසනවා විය හැකි යි. උදාහරණයක් ලෙස, ඔබ ජීවත් වන්නේ කුඩා රටක නම්, "අප කුඩා වැඩී යි. අනෙක් විශාල රටවලට අභියෝගය භාර ගැනීමට අපි ඉඩ දෙමු යි" යනුවෙන් ඔබ කියනවා විය හැකි ය.

එහෙත්, කුඩා පියවර වැදගත් වෙනවා. එසේ වන්නේ විශේෂයෙන්, ඒවා ලොව පුරා සිටින පුද්ගලයින් විසින් එක ම කාලයේ දී ගනු ලබන්නේ නම් පමණයි. නිදසුනක් වශයෙන්, අප්‍රිකාවේ, සූර්ය පැනල වැනි පුනර්ජනනීය ශක්තියෙන් බල ගැන්වෙන ජංගම දුරකථන තාක්ෂණයන් මෙම වෙනස්වීම සඳහා වූ ප්‍රබල මෙවලම් බවට පත් ව තිබෙනවා. මෙම තාක්ෂණය, පුද්ගලයින් අතර ඩිජිටල් ලෙස මුදල් හුවමාරු කිරීමේ සරල ක්‍රම සමඟ ඒකාබද්ධ වී තිබෙනවා. එම තාක්ෂණය හේතුවෙන් සාම්ප්‍රදායික විශාල බලශක්ති සැපයුම්කරුවන් මත හෝ දුරස්ථ බැංකු පහසුකම් මත රඳා පවතින්නේ නැතිව, පුද්ගලයින්ට, ව්‍යාපාරිකයින්ට අධ්‍යාපනඥයින්ට, වෛද්‍ය වෘත්තිකයින්ට සහ සෙසු අයට ඉතා ඵලදායී ලෙස එක්ව වැඩ කිරීමේ හැකියාව ලබාදෙනවා.

ඔබ අවට ප්‍රදේශයේ සිදු වන කුඩා වෙනස්කම් මොනවා ද?

Missing section ↓

ඒ සියල්ල ධනාත්මක වෙනස පිළිබඳව යි.

ඔව්, මිනිසුන්ට ඔවුන්ගේ හැසිරීම වෙනස් කිරීමට සිදුවනු ඇති. එහෙත් වෙනස්කම් සෑම කෙනෙකුට ම සාධාරණ වන බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති තිබිය යුතු යි.



තොරතුරු සහ දැනුම සමාන ව බෙදා ගත යුතු යි; ලොව පුරාම!




ඔවුන් කතා කරන්නේ කුමක් පිළිබඳ ව දැයි නායකයින් දැන ගත යුතු ව තිබෙනවා.






පැරිස් ගිවිසුම පැහැදිලි කඩඉම් සහිත විශාල පියවරක් වෙනවා. එය අප සියල්ලන් ම පිරිසිදු ශක්තිය කරා යන මාවතට යොමු කර තිබෙනවා.

මෙවැනි මාර්ගෝපදේශ සහ නීතිරීති ජාතික නායකයින්ට, ප්‍රාදේශීය නායකයින්ට සහ ඔබ සහ මා වැනි ~~එදිනෙදා ජීවත්වන~~ පුද්ගලයින්ට පැහැදිලි සැලසුම් සැකසීමට සහ ඉලක්ක කරා යෑමට උපකාරී වෙනවා.






## පැරිස් ගිවිසුම - විශිෂ්ට ආරම්භයක්

ගෝලීය උණුසුම් වීම මන්දගාමී කිරීමේ ලෝක ප්‍රයත්නයක් ලෙස රටවල් 195 ක කණ්ඩායමක් හරිතාගාර වායු (ප්‍රධාන වශයෙන් කාබන් ඩයොක්සයිඩ් අඩු කිරීමට 2015 දී ඇති කර ගන්නා ලද පැරිස් ගිවිසුම ගැන ඔබ අසා ඇති. එය අප වටා දකින වෙනස්කම් නිර්මාණය කෙරෙන වැදගත් ඉලක්ක සකසා තිබෙනවා.

එහෙත් අපගේ රටවල්, නායකයන් සහ අප වැනි පුද්ගලයන් අපේ පරණ පුරුදු වෙනස් කර ගෙන ඉදිරියට යන්නේ කොහොම ද?

පැරිස් ගිවිසුම සමඟ ඒකාබද්ධ ව නීතිරීති සහ රෙගුලාසි (නීති සහ නියෝග) වැනි වෙනත් සක්‍රිය රාමු රැසක් තිබෙනවා. මේවායින් බොහොමයක් රථවාහන පාලනය, මෝටර් රථ දුම, ගොඩනැගිලි නීතිරීති සහ අපද්‍රව්‍ය වැනි දේ පිළිබඳ දේශීය නීතිරීති වේ. නිෂ්පාදනය සහ බෙදා හැරීම සඳහා ශක්තිය භාවිත කරන ආකාරය වැනි දේ පිළිබඳව මඟ පෙන්වීමට සහ මිණුම් කිරීමට නව ප්‍රමිති (ශ්‍රේණි සහ මට්ටම්) ද තිබෙනවා. නැවතත්, රූපයේ දැක්වෙන පිරිමි දරුවා දෙස බලන විට, ඔහුගේ ලෝකය අන් අයගේ ලෝකය හා සමාන කිරීමට ඔහු සිටින තත්ත්වය තුළ තවත් බොහෝ දේ කළ යුතු බව අපට පෙනෙනවා.

ඔබට ඒ සඳහා උදව් කළ හැක්කේ කෙසේ ද?




මේ දරුවාගේ ජීවිතය පිළිබඳ දැනට අප දකින චිත්‍රය අවසානයේ දී වෙනස් කරනු ලබන ප්‍රතිපත්ති, නියෝග සහ නීති සැකසෙනු ඇත.

අහිතකර වායු විමෝචනය වීම අවම මෝටර් රථ සහ ට්‍රක් රථ සඳහා ඔහුගේ රට තුළ නියෝග පැනවූ විට, රථවාහනවලින් සිදු වන පරිසර දූෂණය විශාල ලෙස අඩු වෙනු ඇති.




පොදු ප්‍රවාහනයෙන් ගමන් කිරීමට ජනතාව දිරිමත් වේවි.




එසේ ම පා පැදි, විදුලි බයිසිකල් සහ විදුලි ස්කූටර භාවිත කිරීම වැනි පිරිසිදු ක්‍රමවලින් වායු විමෝචනයක් සිදු වන්නේ නැහැ.




බොහොමයක් වෙනස්කම් සඳහා විදුලිබලය ඉතා ප්‍රධාන වෙනවා.



ගුවන් යානාවල කාර්යක්ෂමතාව සහ වායු විමෝචනයට අදාල වෙනස්කම් අපට අපේක්ෂා කළ හැකි වෙනවා.




විවෘත ගින්නෙන් පිට වන සියලු ම දුම් මිනිසුන්ගේ සෞඛ්‍යයට අහිතකර ලෙස බලපානවා. එය පරිසර දූෂණය සිදු කරන අතර ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට ද දායක වෙනවා. පිරිසිදු වාතය සඳහා ප්‍රතිපත්ති සැකසෙනු ඇති.




නිවාස උණුසුම් කිරීමට සහ සිසිල් කිරීමට අවශ්‍ය බලශක්තිය පිළිබඳ ව සලකා බැලෙනු ඇති. කොපමණ ශක්තියක් භාවිත කරන්නේ ද යන්න පිළිබඳ ව නීති රීතිද හඳුන්වා දෙනු ඇති. එසේ ම මෙම පද්ධති කෙතරම් කාර්යක්ෂම ද යන්න සළකා බැලෙනු ඇති.




අප දකින චිත්‍රය අවසානයේ වෙනස් වේවි. එය බොහෝ ඈතක බව පෙනෙනවා. එහෙත් ජනතාව ධනාත්මක වෙනසක් සඳහා කටයුතු කරමින් සිටිනවා.

හොඳ ප්‍රතිපත්ති මගින් මෙම වෙනස ඇති කිරීමට හැකියාව ලබා දේවි.



## යමක් සිදු කිරීම සඳහා ක්‍රම

මෙම කතාන්තරයේ එන කාර්ය බහුල මාර්ගය එහි වාහන තදබදයට සහ එමගින් ඇති කෙරෙන පරිසර දූෂණයට ප්‍රසිද්ධ යි. ඇත්ත වශයෙන් ම, ලොව පුරා ගුවන් යානා පියාසර කරන කාර්ය බහුල ගුවන් තොටුපළක් වෙතට සහ ඉන් පිටතට විහිදී ඇති මහා මාර්ග ද එම පරිසර දූෂණයට දායක වෙනවා. සියලු මෝටර් රථ, ට්‍රක් රථ සහ ගුවන් යානා සඳහා ඉන්ධන වශයෙන් ඛනිජ තෙල් වැනි පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව භාවිත කරනු ලබනවා. ඒ මගින් එකවර කාබන් ඩයොක්සයිඩ් වායුව විශාල ප්‍රමාණයක් පිට කෙරෙනවා.

ඛනිජ තෙල් බලයෙන් ක්‍රියාත්මක වන නව මෝටර් රථ නිශ්චිත වසරක සිට අලෙවි කළ නොහැකි බව දැක්වෙන ප්‍රතිපත්ති බොහෝ රටවල් දැන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. මෙම ප්‍රතිපත්තියෙන් අදහස් වන්නේ ජනතාවට විදුලි මෝටර් රථ, විදුලි ට්‍රක් රථ යනාදිය වෙත මාරු වීමට සිදු වනු ඇති බව යි.

මෙම වෙනස්කම් සිදු වුව හොත් ඇති වන තත්ත්වය කෙතරම් වෙනස් වනු ඇති දැයි සිතා බලන්න. එහෙත් මේ තරම් දුප්පත් රටක වෙනසක් සිදු වන්නේ කෙසේ ද? මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය හැකි ද? එය සාධාරණීකරණය කර ගන්නේ කෙසේ ද?

නව ප්‍රතිපත්ති අන්තර්කරණ, යුක්ති සහගත සහ සාධාරණ බවට පත් කිරීමට ඔබට යම් දෙයක් කළ හැකි ද?